**11**
**පාඩම**
**एकादशः पाठः**

# උක්තපද හා ක්‍රියාපද යොදා වාක්‍ය තැනීම

## 11.1 ක්‍රියාකාරකම

වර්තමාන කාල (लट् - लकार) ක්‍රියා පද වාචොද්ගත කරන්න.

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | जयति<br>දිනයි | जयतः<br>(දෙදෙන) දිනත් | जयन्ति<br>දිනති |
| मध्यमपुरुष | जयसि<br>දිනහි | जयथः<br>(දෙදෙන) දිනහු | जयथ<br>දිනහු |
| उत्तमपुरुष | जयामि<br>දිනමි | जयावः<br>(දෙදෙන) දිනමු | जयामः<br>දිනමු |

## 11.2 ක්‍රියාකාරකම

පහත සඳහන් ක්‍රියාපද වාචෝද්ගත කරමු.

| | | | | | |
|---|---|---|---|---|---|
| १ | नमति | - වඳියි | ७ | उपविशति | - හිඳගනියි |
| २ | वहति | - උසුලයි | ८ | प्रेषयति | - යවයි |
| ३ | ताडयति | - තළයි | ९ | कुप्यति | - කිපෙයි |
| ४ | जयति | - දිනයි | १० | असूयति | - ඊර්ෂ්‍යා කරයි |
| ५ | प्रहरति | - පහර දෙයි | ११ | तुष्यति | - සතුටු වෙයි |
| ६ | रक्षति | - රකියි | १२ | निर्गच्छति | - නික්මෙයි |


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

| | | | | | |
|---|---|---|---|---|---|
| १३ | प्रभवति | - හටගනියි | १९ | अनुतिष्ठति | - අනුව පවතියි. |
| १४ | विलसति | - බබළයි | २० | रवति | - නාද කරයි |
| १५ | उत्तिष्ठति | - නැගිටියි | २१ | क्षिपति | - බහාලයි/විසි කරයි |
| १६ | वपति | - වපුරයි | २२ | विलुठति | - පෙරළෙයි |
| १७ | अवतरति | - බසියි | २३ | छादयति | - වසයි |
| १८ | कर्षति | - සීසායි | २४ | स्निह्यति | - සෙනෙහෙ කරයි |

## ප්‍රථමා විභක්තිය හඳුනාගනිමු.

❖ වාක්‍යයක ක්‍රියාවෙන් කියැවෙන පදය **උක්තය යි. උක්තය** යෙදෙන්නේ ප්‍රථමා විභක්තියෙනි. වාක්‍යයක ක්‍රියාපදය යෙදිය යුත්තේ එම වාක්‍යයේ උක්තපදය අයත් වන වචනයට හා පුරුෂයට සමාන ව ය.

❖ **बालः पठति।** (ළමයා පාඩම් කරයි.) මෙම වාක්‍යයේ **बालः** යන උක්තය ප්‍රථමා විභක්ති, ප්‍රථම පුරුෂ ඒකවචන පදයකි. එනිසා ක්‍රියාපදය ද **पठति** යන ප්‍රථම පුරුෂ ඒකවචනයෙන් යෙදී ඇත. ද්වි වචන, බහුවචනවල දී ද මෙම ක්‍රමය අනුගමනය කළ යුතු වෙයි.

උදාහරණ:- ප්‍ර:පු: ද්විවචන - कुमारौ धावतः।
කුමාරයෝ දෙදෙනා දුවත්.

ම:පු: ඒකවචන - त्वं धावसि।
නුඹ දුවහි.

උ:පු: ඒකවචන - अहं धावामि।
මම දුවමි.

## 11.1 අභ්‍යාසය

පහත සඳහන් සංස්කෘත වාක්‍ය සිංහලයට පරිවර්තනය කරන්න.

१ पालकः रक्षति।
२ उपासकः नमति।
३ नरः हसति।
४ बालकः पठति।
५ त्वं तुष्यसि।
६ वृषभौ खादतः।
७ अहं पश्यामि।
८ कृषीवलः निर्गच्छति।
९ काकः निर्गच्छति।
१० आवां पश्यावः।
११ कलन्दकाः पतन्ति।
१२ योधाः वहन्ति।
१३ युवां तुष्यथः।
१४ वृक्षौ फलतः।
१५ यूयं तुष्यथ।
१६ वयं पश्यामः।
१७ जनकः स्निह्यति।
१८ कुक्कुटाः भुञ्जन्ति
१९ भटाः उत्तिष्ठन्ति।
२० नायकाः विलसन्ति।

## 11.2 අභ්‍යාසය

පහත සඳහන් සිංහල වාක්‍ය සංස්කෘතයට පරිවර්තනය කරන්න.

1. පාලකයා රකියි.
2. මිනිස්සු සතුටු වෙත්.

3. සෙබළු දිනත්.

4. පරෙවියා ගෙන යයි.

5. මහල්ලෝ රකිත්.

6. බල්ලෝ දෙදෙන රකිත්.

7. හිරු බබළයි.

8. කුකුල්ලු කිපෙත්.

9. ගොවියෝ සීසාත්.

10. යෝධයා පහර දෙයි.

11. උපාසකයෝ දෙදෙන වඳිත්.

12. නැවියෝ දෙදෙන යති.

13. සිවල්ලු දෙදෙන නික්මෙත්.

14. නායකයෝ දෙදෙන ඊර්ෂ්‍යා කරත්.

15. සිංහයෝ නාද කරත්.

16. පියවරු සෙනෙහෙ කරත්.

17. රථය පෙරළෙයි.

18. පුරුෂයෝ දෙදෙන හෙලත්.

19. ගොවියෝ දෙදෙන වපුරත්.

20. සිවල්ලු බසිත්.